ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිලංග සුමතිපාල මහතා විසින්
2013 ජූලි මස 11 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 ජුනි මස 17 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[256 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 007428—750 (2013/07)

## ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය
## (සංස්ථාගත කිරීම)

### ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"ශ්‍රී ලංකා ඉදිකිරීම් මණ්ඩලය " යනුවෙන් හඳුන්වනු ලබන හා ප්‍රකට ආයතනයක්, එකී මණ්ඩලයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී මණ්ඩලයේ පරමාර්ථ සහ ඊට අදාළ සියලු කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද;

එකී මණ්ඩලය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් මණ්ඩලය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2013 අංක    දරන ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු 'සංස්ථාව' යනුවෙන් සඳහන් කරනු ලබන) 'ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනුයේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) 1982 සමාගම් පනතේ 21 වැනි වගන්තිය යටතේ සංස්ථාපිත සහ ඉන් පසුව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ

2—PL 007267—75 (2013/05)

2008 සැප්තැම්බර් මස 03 වැනි දින නැවත ලියාපදිංචි කරන ලද ශ්‍රී ලංකා ඉදිකිරීම් මණ්ඩලයේ කටයුතු සහ කර්තව්‍යයන් සහ එකී මණ්ඩලයේ වත්කම් සහ බැරකම් පවරා ගැනීම;

(ආ) ජාතික ඉදිකිරීම් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම, එහි අවශ්‍යතා නියෝජනය කිරීම සහ ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල නියැළී සිටින අයගේ මතය ප්‍රකාශ කිරීම;

(ඇ) ජාතික වැදගත්කමක් ඇති කරුණු සම්බන්ධයෙන් ජාතික ව්‍යවස්ථාපිත සහ ව්‍යවස්ථා සම්පාදක ආයතන විසින් උපදේශනය ලබාදීම පිණිස ජාතික ඉදිකිරීම් කර්මාන්තය සඳහා විශේෂිත මණ්ඩලයක් වශයෙන් කටයුතු කිරීම;

(ඈ) ජාතික ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය දිරිගැන්වීම සහ රාජ්‍ය බලධාරීන් විසින් සියලු අවස්ථාවල දී ම එය පිළිගනු ලැබීම සඳහා කටයුතු කිරීම;

(ඉ) ජාතික වැදගත්කමක් ඇති කරුණු අධ්‍යයනය කිරීම සඳහා ජාතික ඉදිකිරීම් කර්මාන්තයට පොදු අවස්ථාවක් සලසා දීම සහ රාජ්‍යය මගින් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඊ) ජාතික ඉදිකිරීම් කර්මාන්තය තුළ වෘත්තිකයන්ගේ මණ්ඩල පිහිටුවීම සහ ව්‍යාපෘති පිළිබඳ තක්සේරු කිරීම සහ වාර්තා හා සහතික නිකුත් කිරීම මෙන් ම සාමාජිකයන්ට උපකාරී වන අතර ම මණ්ඩලයේ අරමුදල්වලට ද දායකත්වය ලබා දෙන පරිදි, එකී ව්‍යාපෘතිවලින් පැන නගින ආරවුල් විසඳීම සම්බන්ධයෙන් කටයුතු කිරීම;

(උ) ස්වකීය සම්පත් උපයෝජනය කර ගනිමින් හෝ බාහිර අරමුදල් මඟින්, ජාතික ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනයට දායක වන ශිෂ්‍යත්ව / අධිශිෂ්‍යත්ව ඇති කිරීම සහ ඉදිකිරීම් කර්මාන්තයේ වෘත්තීන්හි යෙදීමට අදහස් කරන අයට උපකාර කිරීම, එවැනි පරමාර්ථයක් සඳහා ගෙවනු ලබන

හෝ පරිත්‍යාග කරනු ලබන අරමුදල්වල භාරකරු, රැකවරණ සලසන්නා, භාරකරුවන් හෝ කළමනාකරුවන් වශයෙන් ද මණ්ඩලය කටයුතු කරනු ඇත. මණ්ඩලය කැමැති වන අනෙකුත් අරමුණුවලට අනුකූල වන කවර හෝ භාරයන් නිර්මූල්‍ය ආකාරයෙන් හෝ වෙනත් ආකාරයකින් ක්‍රියාවේ යෙදවීම ද එය භාරගනු ඇත;

(ඌ) කර්මාන්තයට අදාළ පාඨමාලා සම්බන්ධයෙන් පුහුණුව ලාබදීම හා පරීක්ෂණ පැවැත්වීම සහ ඒ පිළිබඳව සහතික නිකුත් කිරීම;

(එ) ජාතික ඉදිකිරීම් කර්මාන්තය තුළ වෙළෙඳ සමාගම් සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ කේන්ද්‍රස්ථානයක් වශයෙන් කටයුතු කිරීම; සහ

(ඒ) සිය සාමාජිකයන් සඳහා දේශීය හා විදේශීය කොන්ත්‍රාත් ලබා ගැනීම පිළිබඳව අවධානය යොමු කරන ආයතනයක් හෝ ආයතන මණ්ඩලයේ අතිරේක අංශයක් වශයෙන් පිහිටුවීම සහ සිය ඉලක්ක සපුරා ගැනීම සඳහා කවර හෝ කාර්යයක් හෝ සේවා ඉටු කිරීම සඳහා එවැනි අතිරේක අංශවලට බලතල ලබාදීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

**4.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට තත්කාලයේ පවත්නා සංස්ථාවේ රීතිවල නියමයන්ට සහ මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව පත් කර ගනු ලබන මහ ලේකම් / ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමුඛ කළමනාකරණ මණ්ඩලයෙන් සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීති අනුව අදාළ බලතල පැවැරී ඇති සභාව සහ කළමනාකරණ මණ්ඩලය මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම නිලධාරි මණ්ඩලය, සභාව හා කළමනාකරණ මණ්ඩලය ද, මේ පනත ක්‍රියාත්මක වීම ඇරැඹි දිනට පෙරාතුව ම වූ දිනයේ දී අදාළ තනතුරු දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) සංස්ථාවේ ඒ ඒ තනතුරු දැරීම සංස්ථාවේ රීතිවල දැක්වෙන නියමයන්ට අනුකූල ව සිදු විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යෑමේ සහ වැසීමේ ද, ඇප ඇති ව හෝ නැති ව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හෝ පරිත්‍යාග හෝ භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයෙහි නියුක්ත කරවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළු ව සංස්ථාවේ සියලු ම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා, කාරණා සහ දේ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා කලින් කල යම් වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී හෝ පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට අනනුකූල නොවන පරිදි මේ වගන්තියේ ඊට කලින් සඳහන් කිසිදු නෛතික විධානයකට අනනුකූල නොවන ආකාරයෙන් රීති සෑදීම, සංශෝධනය කිරීම, අලුතින් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කළ හැකි ය. සංස්ථාවේ රීති ඒ හා සමාන රැස්වීමක දී ඒ හා සමාන ආකාරයකින් සංශෝධනය කිරීම, ඊට යමක් එකතු කිරීම සහ පරිච්ඡින්න කිරීම ද කළ හැකි ය.

(2) මේ පනත ආරම්භ වන දිනයෙහි බලාත්මක ව පැවැති සංගමයේ රීති මේ පනතේ හෝ අදාළ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට සංස්ථාවේ රීති වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

රීති අනුකූලව විවිධාකාර වූ මුදල් අය කර ගැනීමට ඇති බලය.

**7.** මෙම සංස්ථාව විසින් සිය සාමාජිකයන්ගෙන් අය කර ගැනීම උචිත යැයි සැලකෙන සාමාජික මුදල්, දායක මුදල්, දඩ මුදල්, ආධාර මුදල් හෝ ඇතුළත්වීමේ ගාස්තු හෝ වෙනත් ගාස්තු යනාදී වශයෙන් වූ කවරාකාරයක හෝ මුදල් අය කිරීමට සංස්ථාවට නීත්‍යානුකූල බලය සහ හැකියාව තිබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, පැවැරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල් හෝ ගාස්තු කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක හෝ සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යෑමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියැවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපළ කවර ස්ථානයකින් උපලබ්ධි වුව ද, මෙහි දක්වා ඇති පරිදි, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය උදෙසා පමණක් ම යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල්, දේපල ආදියෙන් කිසි ම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙළින් ම වේවා, අන්‍යආකාරයකින් වේවා, ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, බද්දට ගැනීමක්, තෑගි කිරීමක්, කිසි යම් ගිවිසුමක් මත හෝ අන්තිම කැමැති පත්‍රයකින් දේපල බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපලක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති ඇතර, එවැනි සියලු දේපල සංස්ථාව විසින් දැරිය යුතු ය. තව ද, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයකට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අය විය යුතු මුදල්.

**11.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී මණ්ඩලය විසින් ගෙවිය යුතුව තිබූ සියලු ණය සහ බැරකම් මෙයින් ස්ථාපය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, ඒ දිනට මණ්ඩලයට අය විය යුතු ව තිබූ සියලු ණය, දායක

මුදල් හෝ කවරාකාරයක හෝ මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු කවර හෝ යම් දේපලක් ඉතිරිවුව හොත් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, යම් ආදායමක් හෝ දේපලක් හෝ සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් ආයතන, පදනම්, සංගම් හෝ සමිති එකකට හෝ වැඩි ගණනකට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ කවරක් ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර හෝ සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

සංස්ථාවේ ගිණුම් සහ විගණනය.

**12.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය අප්‍රේල් මාසයේ 01 වැනි දින සිට ඊළඟ වර්ෂයේ මාර්තු මාසයේ 31 වැනි දා දක්වා විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් මහ සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා", යන්නෙන්,—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ නියැළීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු ය.

**13.** කවර ප්‍රභවයකින් ව්‍යුත්පන්න වූව ද, සංස්ථාවේ මුදල් සහ දේපල හුදෙක් ම මෙහි සඳහන් කර ඇති සංස්ථාවේ පරමාර්ථ නංවාලීම උදෙසා යොදා ගත යුතු අතර, ඉන් කිසි ම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ණය, ප්‍රසාද මුදල් හෝ වෙනත් කවර වුව ද, ආකාරයකට ලාභ වශයෙන් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම හෝ කරනු නොලැබිය යුතු ය.

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන මගින්—

(අ) සංස්ථාවේ යම් නිළධරයකු හෝ සේවකයකු විසින් කරන ලද යම් සේවාවක් වෙනුවෙන් සද්භාවයෙන් යම් සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයක් ඔහුට ගෙවීම;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු යම් සමාගමක කොටස්කරුවකු වන අවස්ථාවක ඒ සමාගම විසින්, සංස්ථාවට කුලියට දෙන ලද ස්ථානයක් සඳහා සාධාරණ නිසි කුලියක් ගෙවීම; සහ

(ඇ) තම කටයුතු හෝ කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමේ හා සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් කළමනාකරණ මණ්ඩලයෙන් කලින් ලබා ගන්නා ලද අනුමැතිය ඇතිව දරන ලද යුක්තිසහගත හා නිසි වියදම් ආපසු ගෙවීම හෝ පියවීම,

තහනම් නොවේ.

සංස්ථාවේ මුද්‍රාව.

**14.** සංස්ථාවේ මුද්‍රාව, නිලධාරියකු සහ ප්‍රධාන විධායක නිලධාරි/මහ ලේකම් ඉදිරිපිට දී මිස කිසි ම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිර ව විය යුතු ය.

**15.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**16.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.